# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.08.27 පැය 2310 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1655 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |

<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

## 01. දිය අනතුරකින් විදේශීය ජාතික කාන්තාවක් බේරාගැනීම - තංගල්ල මැඩිල්ල පොලිස් ජීවිතාරක්ෂක ඒකකය.

2025.08.27 වන දින සවස් කාලයේදී තංගල්ල පොලිස් වසමේ මැඩිල්ල වෙරළ තීරයේ දියනාමින් සිටි විදේශීය ජාතික කාන්තාවක් දිය වැලකට හසුව ගසාගෙන යමින් සිටියදී, වෙරළ තීරයේ රාජකාරී යෙදී සිටි පොලිස් ජීවිතාරක්ෂක ඒකකයට අනුයුක්ත උප පොලිස් පරීක්ෂක නිමල් දිසානායක, පොලිස් සැරයන් 23944 ආර්.ජී. සමීර, පොලිස් සැරයන් 60750 තුෂාර හා පොලිස් කොස්තාපල් 70934 පුෂ්පකුමාර යන නිලධාරීන් විසින් බේරාගෙන ප්‍රථමාධාර ලබාදීමට කටයුතු කර ඇත.

**අනතුරට පත් කාන්තාව වයස අවුරුදු 22 ක් වන ප්‍රංශ ජාතික කාන්තාවකි.**

## 02. විදුලි සැර වැදී පුද්ගලයෙකු මියයාම - තෙරිපැහැ පොලිස් වසම.

2025.08.27 වන අද දින උදෑසන කාලයේ තෙරිපැහැ පොලිස් වසමේ කොවිල්කඳුර ප්‍රදේශයේ පුද්ගලයෙකු විදුලිසැර වැදී මියගොස් ඇති බවට තෙරිපැහැ පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශනයක් ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 39 ක් වූ කොවිල්කඳුර, යටිමාදුර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මරණකරු විසින් තම නිවස අසල කුඹුරට යොදන ලද අනවසර විදුලි රැහැනක ගැටී විදුලි සැර වැදීමෙන් මියගොස් ඇති බවට දැනට සිදුකරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය නුවරඑළිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර තෙරිපැහැ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. මාරක රිය අනතුරක් - දඹුල්ල පොලිස් වසම.**

2025.08.27 වන අද දින උදෑසන කාලයේ දඹුල්ල පොලිස් වසමේ දඹුල්ල කුරුණෑගල මාර්ගයේ පොහොරන්වැව ප්‍රදේශයේදී කුරුණෑගල දෙස සිට දඹුල්ල දෙසට ධාවනය වූ යතුරු පැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන දුරකතන රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ යතුරු පැදිකරු දඹුල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 37 ක් වූ මීගස්වැව, මැදිරිගිරිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය දඹුල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර දඹුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**